**SYMBOL - TILL**

කැටය/ உண்டியல்

ඔක්කොම වැසියෝ - ඔක්කොම රජවරු

ஒக்கம வெசியோ - ஒக்கம ரஜவரு

**OKKOMA WASIO – OKKOMA RAJAVARU**

(All subjects- All Rulers) Rgd. by the El.Com.-PE-1/43

3/1, සංඝමිත්තා මාවත, මහනුවර. / 3/1, Sanghamittha Mawatha, Kandy.

# ව්‍යවස්ථා මාලාව

# ව්‍යවස්ථා මාලාව

## "ඔක්කොම වැසියෝ - ඔක්කොම රජවරු" සංවිධානය

## පූර්විකාව

මානව වර්ගයා රැහින් රැහැට ලෙයින් ලෙයට යම්කිසි ගුණ සමුදායක් උරුමකරගෙන පැවත එති. කලින් කලට කෙනින් කෙනා තුළ ඇතිවන බල තන්හාවේ අඩුවැඩි කමේ අනුපාතය අනුව මෙම ගුණ සමුදායේ ගුණාත්මක බවද ධන ඍණ වෙමින් පැවත එයි. නූතන සමය එහි දැඩි ඍණාත්මක යුගයක් බව බැලූ බැල්මට පෙනී යයි. ඇස් පනාපිට සත්‍ය, යුක්තිය, සාධාරණය කණපිට පෙරළෙමින් ඇත්ත නැත්ත කිරීමට දිව රෑ වෙහෙසෙමින් මිනිසුන් කටයුතු කරමින් සිටිති.

මේ පිළිබඳව කම්පාවීමේ අවශ්‍යතාවයන් නැත. "අටලෝ දහම රිය සක ලෙස පරලේ" යන මනුස්ස කියමන ආදර්ශයට ගෙන කළ යුතුව ඇත්තේ මෙයට පිළියමක් සෙවීමය. අපමණ සනාථන දහම් ලෝකයේ තිබුනද එහි ඇති සත්‍ය පවා කුළු ගැන්වීමට දගලන සමාජයකට යොමුවිය යුතුව මුළු මහත් මානව වර්ගයම වැළඳගන්නා සමානාත්මක, ධනාත්මක, ප්‍රායෝගික ක්‍රියා පිළිවෙතක් බව පැහැදිලිය.

ඔක්කොම වැසියෝ ඔක්කොම - රජවරු සංවිධානය හරහා ජනතාව වෙත නිහතමානීව ඉදිරිපත් කිරීමට උත්සුක වන්නේ මෙම අවශ්‍යතාවය සපුරාලිය හැකි ක්‍රියාදාමයකි.

1992 වර්ෂයේ සිටම "ගුඩ් හාර්ට්ස්" නැමැති පදනමක් මෝදු කරගෙන අංක CP/SS/K/Gr 144/92 යටතේ ලියාපදිංචිකර දිස්ත්‍රික් 18ක ඇතැම් සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ගම්මාන වල මෙන්ම විදුහල්වල වැඩිහිටි හා ශිෂ්‍ය කණ්ඩායම් අතර ශික්ෂණ කමිටු පිහිටුවා සත්පුරුෂ සමාජයක් බිහිකිරීමට සුළු වශයෙන් හෝ උත්සාහයක් දරන ලද්දේ ඉහත සඳහන් අරමුණු සමාජ සේවයක් ඔස්සේ සාක්ෂාත් කර ගැනීමටය. එහෙත් කෙනෙකු ශික්ෂණය කර පවතින සමාජයට මුදාහැරීම රෙද්දක් සුදෝ සුදට සෝදා කසලගොඩක වැනුවා වැන්නක් බව දක්නට ලැබින. එනිසා මෙවැනි දේශපාලන වැඩ පිළිවෙලක අවශ්‍යතාවය පෙනී යන ලදි. මෙම පක්ෂය බිහිවීම එම අකලංක නිර්ව්‍යාජී පියවරේ ප්‍රතිඵලයකි.

## 1. පක්ෂයේ නාමය

අඬහැර, ගොවි හවුල, සත්පවුර, විශ්ව ධර්ම යන නම්වලින් මිට පෙර "ගුඩ් හාට්ස්" පදනම ඔස්සේ පෙරට ආ සංවිධානයම ඔක්කොම වැසියෝ - ඔක්කොම රජවරු හෙවත් ස්වතන්ත්‍රවාදී දේශපාලන සංවිධානය යන නාමයෙන් වෙනම පක්ෂයක් විය යුතු බවට තීරණය විය. එසේ නම් වන ලද්දේ පුද්ගලයා, නිවස, අසල්වැසියා, ගම පෙදෙස, දිස්ත්‍රික්කය හෙවත් දිසාව, රට යන සත්පවුරම වෙන වෙනම වැළඳගෙන එකට යා කෙරෙන සංස්කරණයමය වැඩපිළිවෙලක් මෙම පක්ෂයෙන් ක්‍රියාත්මක වන නිසාය. ස්වතන්ත්‍රවාදී යන වචනය වෙනුවෙන් ස්වාධිපති යන චරිතය දෙවනුව ආදේශ විය.

## 2. ලාංඡනය

දේශපාලන පක්ෂයක් වශයෙන් ඉල්ලුම්කර ලබාගත් මුදල්ත් කැටය පක්ෂයේ ලාංඡනයයි.

## 3. ආදර්ශ පාඨය

කරන හැම කටයුතු - කෙසේ හෝ නොව

කළයුතු දේ දැහැමින්ම - ඉටුවිය යුතු බව සිත්හි තතබා ගත යුතුය.

## 4. ධජය

බහු වර්ණ පසුබිමක පක්ෂයේ නම හා ලංඡනය සහිත ධජය

## 5. කාර්යාලය

පක්ෂයේ කාර්යාලය 3/1, සංඝමිත්තා මාවත, මහනුවර යන ස්ථානයේ දැනට

පවත්වාගෙන යා යුතුය

## 6. පරමාර්ථ විග්‍රහය

- මිනිස්කම පිරිහීමට තුඩුදෙන බලකාමය තුරන් කිරීම් වස් මහජන නියෝජිතයින් තෝරාගැනීමේ නව ක්‍රමයක් රටට හදුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- මහජන නියෝජිතයින් ගේ නිල සේවා කාලය සීමා කිරීමෙන් සෑමපුරවැසියෙකුටම පාලනට සහභාගිවීමට හැකි මාර්ගය හදුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- ඔක්කොම වැසියෝ - ඔක්කොට රජවරු නැමති ව්‍යවස්ථා යෝජනාවලිය රටට හදුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- සේවා අර්ථ ක්‍රමයට ඇති සීග්‍ර නැඹුරුව සීමාකර අවශ්‍ය පමණට පමණක් එය පවත්වාගෙන කෘෂිකාර්මික හා කාර්මික අර්ථ ක්‍රමයක් රටට හදුන්වාදී ක්‍රියාත්මක කිරීම.
- යෝජිත නව ආණ්ඩු ක්‍රමයට අනුකූලවන සහ ආනුසංගික වන අධ්‍යාපන ක්‍රමය, රැකියා නියුක්තිය, සෞඛ්‍ය සේවය, වැඩිහිටි පෝෂණය ආදී ජනතා අවශ්‍යතා හැමටම හැමගේම වන ලෙස සංස්කරණය කිරීම.
- කෘෂිකර්මාන්තය හා කෘෂි අලෙවිය ප්‍රමුඛ කොට ගෙන රටේ ආර්ථිකය හා අධ්‍යාත්මය, සදාචාරය සුරකින ජාතික සැලසුම් හදුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

## 7. සාමාජිකත්වය

- පක්ෂයේ දර්ශන පිළිගන්නා අයට කැමති මුදලක් ගෙවා ඉල්ලුම්පතක් පිරවීමෙන් හෝ සාමාජික ලේඛණය අත්සන් කිරීමෙන් පමණක් සාමාජිකත්වය ලබාගැනීමට හැකිවි යුතුය.
- එසේ ඇතුලත්වන අයගෙන් පක්ෂයේ පැවැත්මට දායකත්වයක් ලබාදිය හැකි අයෙකුට රිසිට්පතක් ලබාගෙන තමන්ට පහසුවෙන් දැරිය හැකි මුදලක් තෙමසකට වරක් හෝ අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව දායක කළ හැකිය. ඒ ආකාරයටම අනුග්‍රාහක මුදලක් ගෙවා අනුග්‍රාහකයෙකු විය හැකිය. එම අය ක්‍රියාකාරී සාමාජිකයන් හා ක්‍රියාකාරී අනුග්‍රාහකයන් වශයෙන් හදුන්වනු ඇත. යමෙකු අවස්ථාවෝචිත විශේෂ මුදලක් හෝ සාමාන්‍ය අනුග්‍රාහක මුදලක් ලබා

දේනම් හෝ ක්‍රියාකාරී අනුග්‍රාහකයෙකු හෝ සාමාන්‍ය අනුග්‍රාහකයෙකු ලෙස හඳුන්වනු ඇත. ලේඛණය අත්සන් කිරීමෙන් පමණක් සාමාජිකත්වය ලබන අය සාමාන්‍ය සාමාජිකත්වය ලබති.

- සාමාජික ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතුය.
- ග්‍රාමීය මට්ටමින් සාමාජිකත්වයට ඇතුල්වීමෙන් ප්‍රාථමික ශාඛාවක්ද, ප්‍රාථමික ශාඛාවෙන් නියෝජිතයින්ගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය ශාඛාද, ප්‍රාදේශීය නියෝජිතයන්ගෙන් සැදුම්ලත් දිස්ත්‍රික් ශාඛාද, දිස්ත්‍රික් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ජාතික මණ්ඩලයක්ද ගොඩනැගිය හැකිය. එමගි සඳහන්වන ජාතික මණ්ඩලය මධ්‍යම කාරක සභාවද කෘත්‍යාධිකාරී මණ්ඩලයද වන්නේය.

## 8. විධායක මණ්ඩලය

- පක්ෂයේ විධායක මණ්ඩලයේ නිලධාරී මණ්ඩලයට පහත සඳහන් අය ඇතුලත් විය යුතුය.
    - පක්ෂයේ නායක හා ජාතික සංවිධායක
    - සභාපතිවරයෙක්
    - නියෝජ්‍ය සභාපති දෙදෙනෙක්
    - ප්‍රධාන ලේකම් නියෝජ්‍ය ලේකම් සහ සහකාර ලේකම්වරු තිදෙනෙක්
    - මුදල් ලේකම්වරයෙක්
    - කාරක සභිකයන් හත්දෙනෙක්

පක්ෂයේ ආරම්භක රැස්වීමේදී පළමුවරට ඉහත සඳහන් නිලධාරී මඩුල්ල පත්කරගත හැකිය. විධායක මණ්ඩලයේ නිල කාලය වසර පහකි. පළමු වසර පහ ඉකුත්වීමෙන් අනතුරුව හෝ යම් හෙයකින් එයට පෙරාතුව සිදුකෙරෙන විධායක මණ්ඩල තේරීමකදී එම තේරීම ව්‍යවස්ථාවේ සඳහන් 14 වන රීතිය අනුව සිදුකල යුතුය. පක්ෂ නායක හා ජාතික සංවිධායක ජීවත්ව නැති විටකදී ඔහු වෙනුවට පක්ෂ නායක තෝරා ගැනීමකදී 14 වන රීතිය අනුව සිදුකල යුතුය. ජාතික සංවිධායක ධුරය අවශ්‍ය පරිදි වෙනස්විය හැකිය.

## 9. විධායක මණ්ඩල රැස්වීම්

- පක්ෂයේ විධායක මණ්ඩලය අඩුම වශයෙන් තුන් මාසයකට වරක් හෝ රැස්විය යුතුය.
- විධායක මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන්ගෙන් 1/3 කි. පක්ෂයේ සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳ සියළුම තීරණ ගැනීමේ බලය පක්ෂයේ නායක, සභාපති, ලේකම් හා මුදල් ලේකම් සතුය. අර්බුධ අවස්ථාවකදී පක්ෂ නායකගේ තීරණය අවසාන තීරණය වන්නේය.
- විධායක මණ්ඩලය විසින් එකී මාසික රැස්වීම සඳහා සුදුසු දිනයක් නියම කරගත යුතුය.
- පූර්ණ දින තුනකට කලින් හෝ ලිඛිත දැනුම් දීමකින් පසු හෝ විධායක මණ්ඩලයේ හදිසි රැස්වීමක් පවත්වනු ලැබිය හැකිය. අවස්ථාවෝචිත පරිදි එය එක් දිනක් හෝ විය හැකිය.
- සෑම විධායක මණ්ඩල රැස්වීමකදීම පක්ෂ නායක හෝ සභාපති හෝ ඔහු නොමැති විටක විධායක මණ්ඩලය විසින් තෝරාගනු ලබන සාමාජිකයෙකු හෝ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

## 10. විධායක මණ්ඩලයේ බලතල හා කාර්යය කටයුතු

පක්ෂයේ විධායක මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල කාර්යය හා කටයුතු ක්‍රියාත්මක කරවීම හා ඉටුකිරීම කළ හැකිය.

- පක්ෂයට සාමාජිකයන් ඇතුලත් කර ගැනීම ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම සහ අස් කිරීම
- සේවකයන් බඳවාගැනීම හා සේවක කාර්යයන් වෙන්කරදීම සහ ඔවුන්ගේ විනය පාලනය සහ සේවයෙන් ඉවත් කිරීම ආදී බලතල ක්‍රියාත්මක කිරීම.
- විධායක මණ්ඩලයේ සභාපති, ප්‍රධාන ලේකම්, සහකාර ලේකම්වරු, මුදල් ලේකම් යන ධූරවල ඇතිවන පුරප්පාඩු පිරවීම.
- උප කමිටු පිහිටුවා ඒවාට කාර්ය නියම කිරීම හා ඒවා විසුරුවා හැරීම.

- ප්‍රධාන ලේකම් මගින් සමිතියේ සියලුම ලිපි ලේඛනාදිය පවත්වාගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තැන්පත් කොට තැබීම.
- මුදල් ලේකම් මගින් පක්ෂයේ ගිණුම් ආදායම් හා වැය පිළිබඳ ලේඛණ පවත්වාගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තැන්පත් කොට තැබීම.
- පක්ෂයේ සියලුම ගිණුම් පරීක්ෂා කිරීම සඳහා සමිති ආඥා පනත යටතේ අනුමත කරන ලද විගණනකරුවන් පත් කිරීම.
- එකී විගණනකරුවන් විසින් පරීක්ෂා කොට සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම.
- පක්ෂයේ ප්‍රයෝජනය සඳහා ඉඩම්, ගොඩනැගිලි, උපකරණ හෝ මුදල් පරිත්‍යාග වශයෙන් හෝ බැංකු ණය ආදී වෙනත් සුදුසු ක්‍රම මගින් අත්කර ගැනීම සහ පක්ෂයේ පරමාර්ථ උදෙසා ඒවා උපයෝගි කර ගැනීම සහ ආයෝජනය කිරීම.
- පක්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීම් සහ විශේෂ සහ සාමාන්‍ය මහ සභා රැස්වීම කැඳවීමට ප්‍රධාන ලේකම්ට නියෝග කිරීම.

## 11. පක්‍ෂයේ නායක විසින්

- පක්‍ෂයේ සියළු කටයුතු පරීක්‍ෂා කිරීම හා මෙහෙයවීමද කළ යුතුය.
- මැතිවරණ ආඥාපනත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම.
- මැතිවරණ තරඟ කිරීම සඳහා සුදුස්සන් තෝරාගැනීම.
- පක්‍ෂයේ විධායක සභා රැස්වීම් මහසභා රැස්වීම් වාර්ෂික මහ සභා රැස්වීම් වල අවස්ථාවෝචිත පරිදි මුලසුන දැරීම.

### 11. (අ) පක්‍ෂයේ සභාපති විසින්

විධායක රැස්වීම් හා මහසභා රැස්වීම්වල මුලසුන දැෲම විධායක මණ්ඩල තීරණ මහ සභා රැස්වීම් වලට ඉදිරිපත් කිරීම පක්‍ෂයේ සාමාන්‍ය කටයුතු නායකතුමාගේ උපදෙස් සහිතව පරිපාලනය කිරීම.

12. ප්‍රධාන ලේකම් විසින්

- වාර්ෂික හා අතිකූත් මහා සභා රැස්වීම් සහ විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම පදනමේ සහ විධායක මණ්ඩලයේ වාර්තා පවත්වාගෙන යෑම.
- සංවිධානයේ මුද්‍රාව ඔප්පු තිරප්පු සහ වෙනත් සියළුම වැදගත් ලිපි ලේඛණ තම ආරක්‍ෂාව භාරයේ තබා ගැනිම සහ දේශපාලන සංවිධානයක් වශයෙන් සංවිධානය පිළිගැනීමත් සමග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා මැතිවරණ ආඥාපනත අනුව පැවරෙන බලතල නායකතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කිරීම.

13. මුදල් ලේකම් විසින්

- පක්‍ෂයට අයත් සියළුම මුදල්වල ආරක්‍ෂාව සහ ඒ මුදල් විධායක මණ්ඩලයේ විධාන පරිදි විය පැහැදැම් කිරීම.
- ලැබීම් හා ගෙවීම් පිළිබඳ නිසි පොත් පත් ක්‍රමවත්ව පවත්වාගෙන යෑම.
- පක්‍ෂයට අයත් සියළු උපකරණ හා දේපල සම්බන්ධයෙන් අවශ්‍ය බඩු වට්ටෝරු හා ලේඛණ තබාගැනීම.
- පක්‍ෂයට අයත් සියළු මුදල් විධායක මණ්ඩලය පිළිගත් බැංකුවක අනිවාර්යෙන්ම තැන්පත් කිරීම සහ ඒ මුදල් අවශ්‍ය පරිදි පක්‍ෂයේ කටයුතු සඳහා විධායක මණ්ඩලයේ උපදෙස් පරිදි පරිහරණය කිරීම.
- පක්‍ෂයේ ගිණුම් පිළිගත් විගණකවරයෙකු ලවා පරීක්‍ෂාකරවා ඔහු විසින් සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව විධායක මණ්ඩලයට සහ මහා සභාවට ඉදිරිපත් කිරීම.
- ඒ වාර්ෂික ගිණුම් වාතාව සෑම වර්ෂයකදීම අදාල දිනයට පෙර නිසි බලධාරීයාට ඉදිරිපත්කිරීම.

# 14. පක්ෂයේ මහා සභා රැස්වීම්

**වාර්ෂික මහා සභා රැස්වීම්**

වාර්ෂික මහා සභා රැස්වීම විධායක මණ්ඩයයේ අනුමැතිය හා තිරණය පරිදි හෝ පක්ෂනායක විසින් හෝ සභාපති විසින් හෝ කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීම් හා සාමාන්‍ය මහා සභා රැස්වීම් යනුවෙනි.

- වාර්ෂික මහා සභා රැස්වීමේ වැඩ සටහන ප්‍රධාන ලේකම්ගේ හා මුදල් ලේකම්ගේ වාර්ෂික වාර්තාව කියවා අනුමත කිරීම. විධායක මණ්ඩලයේ කාලය ඉකුත්වූ විට විධායක මණ්ඩලයක් තෝරාගැනීම ඇතුලත්වේ.
- පක්ෂයේ විධායක මණ්ඩලයේ අනුමැතිය හා තීරණය පරිදි පවත්වනු ලබන විශේෂ මහා සභා රැස්වීම් වැඩ සටහනට රීති සංශෝධනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හා රීති මාලාවට අළුත් රීති එකතු කිරීම යන මේවා පමණක් ඇතුලත්වේ.
- සාමාජිකයන් 100 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් පක්ෂ නායක වෙත ලිඛිත ඉදිරිපත් කෙරෙන ඉල්ලීමක් මගින් ඉදිරිපක් කරනු ලබන විශේෂ කාරණයක් පිළිබඳ තීරණයක් ගැනීම පිණිස පක්ෂයේ නායක විසින් කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමේ වැඩ සටහනට එසේ ඉදිරිපත් කෙරෙන කාරණය පමණක් ඇතුළත්වේ.
- පක්ෂයේ නායක විසින් හෝ සභාපති විසින් හෝ පක්ෂයේ විධායක මණ්ඩලය විසින් හෝ අවශ්‍යයයි අදහස් කරනු ලබන පරිදි පවත්වනු ලබන සාමාන්‍ය මහා සභා රැස්වීම් වල වැඩ සටහනට, සාකච්ඡාවට භාජනය කළ යුතු වැදගත් කරුණු ඇතුලත්වේ.
- සියළුම මහා සභා රැස්වීම්වල මූලාසනය පක්ෂයේ නායක හෝ සභාපති විසින් දැරිය යුතුය. කවර හෝ හේතුවක් නිසා ඔවුන් පැමිණ නොමැති නම් සභාව විසින් තෝරාගනු ලබන සාමාජිකයෙකු මූලාසනය දැරිය යුතුය.
- සියළුම මහා සභා රැස්වීම් සඳහා ගණ පූර්ණයට සාමාජිකයන් 25 දෙනෙකු නැතහොත් එවකට දිවයින තුල සිටින සාමාජික පිරිසෙන් 1/8 වන සාමාජික සංඛ්‍යාවක් සිටිය යුතුය.

- මහ සභා රැස්වීම් සඳහා යටත් පිරිසෙයින් දින දාහතරකට පෙර දැනුම් දීමක් සාමජිකයින් වෙත කළ යුතුය. හදිසි මහ සභා රැස්වීම් සඳහා අවම වශයෙන් දින 07කට පෙර දැනුම්දීමක් කළ යුතුය.

## 15. පක්ෂයේ අරමුදල

- පක්ෂයේ සතු අරමුදලක් තිබිය යුතුය
- මෙම අරමුදලට සාමාජික මුදල් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල් ආධාර මුදල් රජය මගින් හෝ ප්‍රාදේශීය ආයතන මගින් හෝ රජයේ නොවන වෙනත් දේශීය ආයතනවලින් දෙනු ලබන ආධාර, පක්ෂයට අයත් නිශ්චල හා චංචල දේපල වලින් ලැබෙන ආදායම අයත්වේ.
- වෙනත් දේශීය හෝ විදේශීය මාර්ගවලින් ලැබෙන ආදායම් භර කරනු ලැබිය යුතුය.
- පක්ෂයේ විධායක මණ්ඩලය විසින් ස්වකීය කටුතු කිරීම සහ සේවා ඉටුකිරීමෙහිලා යම් වැය ශීර්ෂයක් යටතේ වියදම් කළ යුතුය. මුදල් පක්ෂයේ සේවක පිරිස් සඳහා අවශ්‍ය දීමනා නිලධාරීන් සහ අනෙකුත් ස්වේච්ඡා සේවකයින් විසින් සමිතියේ යම් යම් කටයුතු සඳහා කෙරෙන වියදම්.
- විධායක මණ්ඩලය මගින් වෙන්කොට ඇති මුදලකින් පුණ්‍යාධාර සඳහා කෙරෙන ගෙවීම්.
- විගණන සඳහා වූ ගාස්තු
- කාර්යාලීය සහ අනෙකුත් බඩු බාහිරාදිය මිළට ගැනීම සඳහා අවශ්‍ය මුදල් ගනු ලැබිය යුතුය.
- පක්ෂයට ලැබෙන සියළුම මුදල් පක්ෂයේ විධායක මණ්ඩලය පිළිගත් බැංකුවක තැන්පත් කළයුතු අතර චෙක්පත් පක්ෂයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතුය. එයින් එක් නිලධාරියෙක් පක්ෂයක සභාපති හෝ ප්‍රධාන ලේකම් විය යුතුය.
- හදිසි වියදම් වශයෙන් මුදල් ලේකම් විසින් රු 5000/-ට නොවැඩි මුදලක් තම භාරයේ තබාගත හැකිය.
- පක්ෂයේ පොත්පත් ලිපි ලේඛණ ආදිය පරීක්ෂා කිරීමට ඇති බලය-පක්ෂයේ ප්‍රධාන ලේකම් වෙත දින හතකට කලින් කරනු ලබන ලිඛිත දැනුම්දීමකින් පසුව පක්ෂයේ

ඕනෑම සාමාජිකයෙකුට පක්ෂයේ පොත් පත් ලේඛණ ආදිය පරීක්ෂා කිරීමට බලය ඇත්තේය.

## 17. විගණනය

- වාර්ෂික ගිණුම් පරීක්ෂණය සඳහා අනුමත විගණකවරුන් පක්ෂයේ විධායක මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය.

## 18. නඩු පැවරීම හා නඩු පැවරීමට ඇති බලය

පක්ෂයට නඩු පැවරීමට බලය ඇති අතර නඩු පවරනු ලැබීමටද යටත්වන්නේය. එවැනි අවස්ථාවක් උද්ගතවුවහොත් සභාපති හා ප්‍රධාන ලේකම්ට හෝ බලයලත් නියෝජිතයෙකුට පක්ෂය වෙනුවෙන් ඉදිරිපත්වීමට බලය තිබේ. එසේම විධායක මණ්ඩලයේ තීරණ පරිදි ඒ කාර්යය සඳහා විධායක මණ්ඩලයේ වෙනත් සභිකයෙකු ඉදිරිපත් කිරීමටද විධායක මණ්ඩලයට බලය ඇත්තේය.

## 19. පක්ෂයේ මුදල් වර්ෂය

පක්ෂයේ මුදල් වර්ෂය අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භ වන දොළොස් මාසයේ කාල පරිච්ඡේදය විය යුතුය.

## 20. පක්ෂයේ දේපළ

යම් මිළයට ගැනීමක්, ප්‍රදානයක් ත්‍යාගයක් හෝ යථායෝග්‍ය ආධාරයක් තෙස්තමේන්තුවකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් පක්ෂයේ සතුවන්නාවූ චංචල හා නිශ්චල කවර දේපලක් වුවද භාරගැනීමටත් දැරීමටත් ඒවා පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමටත් පක්ෂයට බලය තිබිය යුතු අතර පක්ෂය තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ බලයද පක්ෂයට තිබිය යුතුය.

## 21. පක්ෂයේ මුද්‍රාව

විධායක මණ්ඩලය මගින් තීරණය කරනු ලබන මුද්‍රාව පක්ෂයට තිබිය යුතුය. මුද්‍රාව පක්ෂයේ ප්‍රධාන ලේකම් භාරයේ තිබිය යුතුය. පක්ෂයේ සභාපති ප්‍රධාන ලේකම් මුදල් ලේඛම් තිදෙනාගෙන් දෙදෙනෙකු ඉදිරිපිටදී මිස මුද්‍රාව කිසිම සාධන පත්‍රයක තබනු නොලැබිය යුතු අතර ඒ නිලධාරීන් දෙදෙනා තමන් පැමිණි බව සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රයට ස්වකීය අත්සන් තැබිය යුතුය.

## 22. රීති සංශෝධනය කිරීම

- පක්ෂයේ රීති සංශෝධනය කිරීම පරිච්ඡින්ත කිරීම හෝ සංශෝධනය කිරීම ඒ කාර්යය සඳහා කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමකදී ඒ යෝජිත සංශෝධන වලට පක්ෂව ඡන්දය දෙන පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් හැර කරනු නොලැබිය යුතුය.
- ඒ ප්‍රතිශෝධන පරිච්ඡන්න කිරීම් හෝ සංශෝධන පක්ෂයේ ලේකම් විසින් හෝ ඔහු පැමිණ නොමැති විටක ඒ රැස්වීමේ මූලාසනය දරණ තැනැත්තා විසින් හෝ ඒ විශේෂ මහ සභා රැස්වීමේදී යෝජනා කරනු ලැබිය යුතුය.

## 23. රීති අර්ථ නිරූපණය

- මේ රීති මාලාවේ යම් රීතියක් අර්ථ නිරූපනය කිරීම සම්බන්ධයෙන් යම් මතභේදයක් පැන නැගුනහොත් පක්ෂයේ ලේකම් මගින් විධායක මණ්ඩලය විසින් දෙනු ලබන අර්ථ නිරූපනය අවසානාත්මක වන්නේය. ඒ අර්ථ නිරූපණ පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට සෑම සාමාජිකයෙකුම බැඳී සිටින්නේය.

- **සාමාජික ආරවුල්**

  පක්ෂයේ කටයුතු හෝ ක්‍රියාකාරීත්වය හෝ සම්බන්ධයෙන් පක්ෂය හා එහි සාමාජිකයන් අතර යම් ආරවුලක් උද්ගතවුවහොත් එය පක්ෂයේ ලේකම් මගින් විධායක මණ්ඩලය වෙත ඉදිරිපත්කරනු ලැබිය යුතු අතර එහිලා විධායක මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේය. ඒ තීරණය කිසිම අධිකරණයක ප්‍රශ්ණ කරනු නොලැබිය යුතු අතර ඒ තීරණය පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට ඒ සාමාජිකයෝ බැඳී සිරින්නාහ.

## 24. පක්ෂය විසුරුවා හැරීම

- පක්ෂය කුමන කරුණක් නිසා හෝ විසුරුවා හරිනු ලැබුවහොත් එහි ශේෂ වත්කම් පුණ්‍ය ආයතනයකට භාරදිය යුතුය.
- ව්‍යවස්ථාව පිළිගැනීම

සංකල්පය හා පක්ෂයේ නිර්මාතෘ එම්. බී. තැම්නීමුල්ල මහතා ඇතුළු අනු කමිටුව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ව්‍යවස්ථා මාලාව ඔක්කොම වැසියෝ - ඔක්කොම රජවරු සංවිධානයේ ව්‍යවස්ථා මාලාව වශයෙන් සුදුසු බවට 2000-06-24 දින මහනුවර 3/1, සංඝමිත්තා මාවත යන ස්ථානයේ පැවති පක්ෂයේ මහ සභාවේදී ජේ. තල්වත්ත මහතා විසින් යෝජනා කරන ලදුව, සීතා දසනායක මහත්මිය විසින් ස්ථිර කර ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

අ/කා. ජේ. තල්වත්ත

ජේ තල්වත්ත
ලේකම්
2000.06.24.

අ/කා. එම්. බී. තැම්නීමුල්ල

එම්. බී. තැම්නීමුල්ල
ඔක්කොම වැසියෝ
ඔක්කොම රජවරු
හෙවත් ස්වතන්ත්‍රවාදී
දේශපාලන සංවිධානයේ
සභාපති
2000.06.24.

පක්ෂයේ නාමය **ඔක්කොම වැසියෝ - ඔක්කොට රජවරු හෙවත් ස්වතන්ත්‍රවාදී පාලන සංවිධානය** යන නමින් වඩාත් පැහැදිලිව හැඳින්විය යුතු බවට 2007-05-19 වන දින මහනුවර 1/3, සංඝමිත්තා මාවත යන ස්ථානයේ පැවති මහසභා වාරයේදී සම්මත විය.

මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංවිධානය පිළිගැනීමත් සමඟ එය **ඔක්කොම වැසියෝ - ඔක්කොට රජවරු** සංවිධානය නමින් පමණක් හඳුන්වනු ලැබේ මේ වන විට යෝජනා ස්ථිරවූ සියළුම සංශෝධන සහිතව ඉහත සඳහන් ව්‍යවස්ථා මාලාව ඒ ආකාරයෙන් පිළිගත යුතු බවට ......14.06.2011...... දින 1/3, සංඝමිත්තා මාවත මහනුවර යන ස්ථානයේදී පැවති මහ සභාවාරයේදී එකච්ඡන්දයෙන් පිළිගන්නා ලදි.

[signature]
.............................
සභාපති

[signature]
.............................
නායක - ප්‍රධාන ලේකම්
එම්. බී. තැම්බිමුල්ල
ඔක්කොම වැසියෝ
ඔක්කොම රජවරු
සංවිධානය

[illegible] ව්‍යවස්ථා මාලාවේ [illegible] පිටපතක් බව - සහතික කරමි.

[signature]
[illegible]
2011.06.14.

[signature]
එම්. බී. තැම්බිමුල්ල
ජාතික නායක / ප්‍රධාන ලේකම්
ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය
ஒக்கம வெசியோ ஒக்கம ரஜவரு
OKKOMA WASIO OKKOMA RAJAVARU
Rgd. by the El. com.-PE - 1/43
3/1 Sanghamiththa Mawatha, Kandy.
14.06.2011